දෙපාර්තමේන්තු චක්‍රලේඛ 02/2022

මගේ අංකය: DAPH/AD/16/2/6
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
පේරාදෙණියේ දී ය.
2022.02. 22

සියලුම පළාත් අධ්‍යක්ෂවරුන්,

සත්ත්ව ගොවිපොළ ලියාපදිංචිය වාර්ෂිකව අලුත් කිරීම.

1958 අංක 29 දරන සත්ත්ව පනතේ 35 වගන්තිය යටතේ පනවා ඇති අංක 1629/17 හා 2009.11.26 දිනැති නියෝගයන්හි 18 හා 19 වගන්තිවල විධිවිධාන කෙරෙහි ඔබගේ අවධානය යොමු කරමි.

02. මෙම විධිවිධාන ක්‍රියාත්මක කිරීම තහවුරු කරනු වස්, සත්ත්ව ගොවිපොළ ලියාපදිංචිය වාර්ෂිකව අලුත් කිරීම අරමුණු කර 2022 වසරේ සිට වාර්ෂික වැඩ පිළිවෙලක් දියත් කිරීමට බලාපොරොත්තු වේ.

03. මෙම වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීමේ දී සමස්ත පශු සම්පත් කේෂ්ත්‍රයේ ප්‍රජාව විසින් අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග පිළිබඳ මාර්ගෝපදේශ සහිත ව මෙම දෙපාර්තමේන්තු චක්‍ර ලේඛය නිකුත් කරනු ලැබේ.

පියවර 1: ගොවිපොළ ලියාපදිංචිය යාවත්කාලීන කිරීම

i. සෑම එළ ගව/ මී ගව ගොවිපොළක්ම සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු ලියාපදිංචිය වාර්ෂිකව අලුත් කළ යුතුය.

ii. ඒ අනුව පශු සම්පත් කේෂේත්‍රයේ සියලුම එළ ගව/ මී ගව ගොවිපොළ 2022 මැයි 30 දින වන විට අදාල වසර සඳහා ලියාපදිංචිය සිදුකර තිබිය යුතුය. මේ සඳහා ගොවීන් උනන්දු කළ යුතු අතර, අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා පළාත් සභා වැඩසටහන්වල දී ලියාපදිංචිය යාවත්කාලීන කරන ලද ගොවීන් කෙරෙහි ප්‍රමුඛතාවය දැක්විය යුතුය.

iii. වසංගත රෝග සඳහා එන්නත්කරණය, රෝග ප්‍රතිකාර, කෘත්‍රිම සිංචන සේවාව මෙන්ම සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව හෝ වෙනත් රාජ්‍ය ආයතන මඟින් මූල්‍යමය හා ද්‍රව්‍යමය ප්‍රතිලාභයන් ලබා දීමේ දී ද, කිරි අලෙවි කිරීමේ ව්‍යාපාර සඳහා ලියාපදිංචිවීමේ දී හා කිරි හා තෘණ අලෙවිකරණය සඳහා ද ගොවිපොළ ලියාපදිංචිය යාවත්කාලීන කර තිබීම තහවුරු කර ගත යුතුය.

iv. සත්ත්ව ගොවිපොළක් ලියාපදිංචි කිරීම මුල් වරට සිදු කරනු ලබන අවස්ථාවේ දී ගොවි මහතා වෙත ගොවිපොළ ලියාපදිංචි අංකය සහිත " සත්ත්ව ගොවිපොළ ලියාපදිංචි කිරීමේ සහතිකය" ක් නිකුත් කර ඇත.

v. එම සහතිකය යාවත්කාලීන කරන වසරට අදාළව රබර් මුද්‍රා තැබීම මඟින් ගොවිපොළ ලියාපදිංචිය අදාළ වසරට අලුත් කර තිබීම තහවුරු කර ගත යුතුවේ.

vi. සත්ත්ව ගොවිපොළ ලියාපදිංචිය වාර්ෂිකව අලුත් කිරීමේ වැඩසටහනට අදාල ආකෘතිය (අලුත් කිරීමේ ඉල්ලුම්පත්‍රය) මඟින් ගොවි මහතාගේ යාවත්කාලීන ගොවිපොළ තොරතුරු ලබා ගත යුතුය.

vii. ගොවිපොළ මුල්වරට ලියාපදිංචි කරන ලද අවස්ථාවේ දී නිකුත් කරන ලද ලියාපදිංචි අංකය කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි යන කොටුව තුළට ඇතුළත් කළ යුතුය.

viii. එක් එක් පශු වෛද්‍ය කොට්ඨාශයට ලබා දී ඇති අංකනය කිරීමේ ක්‍රමවේදය අනුව නව ගොවිපොළ සඳහා අංක ලබා දිය යුතුය. (උපලේඛන 1)

ix. ගොවිපොළ ලියාපදිංචි කරන මුල් අවස්ථාවේ දී එළ ගව / මීගව සඳහා සකසන ලද ගොවිපොළ ලියාපදිංචි කිරීමේ ලේඛනයට එයට අදාළ තොරතුරු ද එළු/ බැටළු/ සූකර සඳහා ඇති ගොවිපොළ ලියාපදිංචි කිරීමේ ලේඛනයට එයට අදාළ තොරතුරු ද කුකුළු ගොවිපොළ ලියාපදිංචි කිරීමේ ලේඛනයට එයට අදාළ තොරතුරු ද ඇතුළත්වන ලෙස ගොවිපොළ ලියාපදිංචි ලේඛන 3ක් පවත්වා ගැනීමෙන් මූලික තොරතුරු ලබා ගැනීම පහසු කරගත හැක. (උපලේඛන 2 A,B,C)

x. ගොවිපොළ ලියාපදිංචි ලේඛණ, උපලේඛන 2 හි A (එළ හා මීගව), B (එළු / බැටළු හා සූකර), C (කුකුළු) අනුව පවත්වා ගත යුතුය.

පියවර 2: ගොවිපොළ ලියාපදිංචි දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම

i. ලබා ගත් තොරතුරු හැකි ඉක්මනින් මාර්ගගත දත්ත පද්ධතිය වෙත ඇතුළත් කළ යුතුවේ. www.vri.lk/lpe/ සබැඳිය මඟින් දත්ත පද්ධතියට පිවිසිය හැකි අතර ඒ සඳහා ඔබ වෙත තොරතුරු තාක්ෂණ ඒකකය, පශු සම්පත් සැළසුම් හා ආර්ථික අංශය, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මඟින් ලබා දී ඇති පරිශීලන නාමය (User Name) සහ මුරපදය (Password) උපයෝගී කර ගත යුතුවේ.

ii. ගොවිපොළ සම්බන්ධ යාවත්කාලීන කළ දත්ත ලබා ගැනීම සඳහා සෑමවිටම පරිගණක පද්ධතිය භාවිතා කළ යුතුවේ.

iii. ගොවිපොළ ලියාපදිංචි ලේඛන, ලියාපදිංචි අයදුම්පත් සහ මාර්ගගත දත්ත පද්ධතිය සෑම පශුවෛද්‍ය කාර්යාලයකම පත්වා ගත යුතුය.

ජාතික කිරි නිෂ්පාදනය වැඩි කිරීමේ ඉලක්ක සාක්ෂාත් කර ගැනීම උදෙසා යාවත්කාලීන කරන ලද දත්ත පද්ධතියක් තම කාර්යාලය තුළ පවත්වා ගැනීමෙන් ගොවීන් වෙත ලබා දියයුතු තාක්ෂණික උපදෙස්, රජයේ ප්‍රතිලාභ, ණය යෝජනා ක්‍රම හා රක්ෂණාවරණ වැනි විවිධ සේවාවන් කඩිනම් කිරීම අපේක්ෂා කෙරෙන බැවින් සියලු නිලධාරීන් මේ සඳහා ප්‍රමුඛත්වය දී කටයුතු කළ යුතු අතර උපරිම දායකත්වය ලබා දෙමින් කැපවීමෙන් යුතුව කටයුතු කරන ලෙස වැඩි දුරටත් කාරුණිකව දන්වමි.

ආචාර්ය කේ.ඒ.සී.එච්.ඒ. කොතලාවල
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්- 01. ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය - කාරුණික දැන ගැනීම සඳහා

02. ලේකම්, පශු සම්පත් ගොවිපොළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය - කාරුණික දැන ගැනීමට හා උක්ත කරුණ සම්බන්ධයෙන් අමාත්‍යාංශය යටතේ පවතින ආයතන දැනුවත් කිරීම සඳහා

03. ප්‍රධාන ලේකම්, බස්නාහිර/දකුණ/මධ්‍යම/ සබරගමුව/ඌව/වයඹ/උතුරු මැද/උතුර/නැගෙනහිර - කාරුණික සහාය ලබා දීම සඳහා

04. ලේකම්, පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය - කාරුණික සහාය ලබා දීම සඳහා

05. දිස්ත්‍රික් ලේකම්වරුන් - කාරුණික සහාය ලබා දීම සඳහා

06. සියලුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන් - කාරුණික අ.ක.ස

07. සියලුම අධ්‍යක්ෂවරුන් /රෙජිස්ට්‍රාර් (සත්ත්ව ආහාර/ පශු ඖෂධ) - කාරුණික අ.ක.ස

08. ප්‍රධාන ගණකාධිකාරී / ප්‍රධාන අභ්‍යන්තර විගණක / ඉංජිනේරු - කාරුණික අ.ක.ස

09. විශේෂඥවරුන් / ප්‍රධාන විද්‍යාඥවරුන් - කාරුණික අ.ක.ස

10. ප්‍රධාන සත්ත්ව නිරෝධායන නිලධාරී / පශු විමර්ශන නිලධාරීන් - කාරුණික අ.ක.ස

උපලේඛන 1

පශු වෛද්‍ය කොට්ඨාශ සඳහා ගොවිපොළ ලියාපදිංචි අංක ලබා දීම.

සත්ව ගොවිපොළ ලියාපදිංචි අංකය ලබා දෙන්නේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ අනුවය. එම අංකය පළාත්, දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල සංකේත අංක වලින් සෑදී ඇත.

එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට ගොවිපොළ 99999 ක උපරිමය දක්වා ලියාපදිංචි අංක ලබා දිය හැක.

උදා :

කුණ්ඩසාල පශු වෛද්‍ය කොට්ඨාශයේ පිහිටි සිරිසේන මහතාගේ ගොවිපලේ ලියාපදිංචි අංකය:

පළාත් සංකේත අංකය (මධ්‍යම පළාත)	2
දිස්ත්‍රික්ක සංකේත අංකය (මහනුවර)	21
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සංකේත අංකය (කුණ්ඩසාලේ)	21 27
සිරිසේන මහතාගේ ගොවිපොළ ලියාපදිංචි අංකය (පළමු ගොවිපොළ)	21 27 00001

කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අවසාන ගොවිපොළේ ලියාපදිංචි අංකය 21 27 99999

උපලේඛන 2-A

Cattle / Buffalo Register

1. General Information						2.1 Cattle												2.2 Buffalo									3.Milk Production				4. Other			
Date	Farm Registration Number	Farmer Name	Address	Contact Number	GN Division	Total			Cows (Milch)			Heifers			Calves		Bulls	Total		Cows (Milch)		Heifers		Calves		Bulls	Total	Home consumption	Value addition	Sold	Environ. Issues		Other issues	
						Crosses		Local	Crosses		Local	Crosses		Local	Female	Male		Indian	Local	Indian	Local	Indian	Local	Female	Male		(litres /day)				yes	No	Yes	No
						European	Indian		European	Indian		European	Indian																					

Swine/ Goat/ Sheep Register

1. General Information						2. Swine							3. Goat								4. Sheep			5. Other			
Date	Farm Registration Number	Farmer Name	Address	Contact Number	GN Division	Total	Breeder		Fattener		Selling time interval (months)		Total	Breeder		Fattener		Selling time interval (months)		Milk production/day	Breeder		Slaughter	Environ. Issues		Other issues	
							Female	Male	Weaners	Piglings	Slauhtering	Breeding		Female	Male	Weaners	kids	Slauhtering	Breeding		Female	Male		yes	No	Yes	No

Poultry Register

1. General Information						2. Poultry										3. Other			
							Breeder			Commercial			Other Poultry			Environ. Issues		Other issues	
Date	Farm Registration Number	Farmer Name	Address	Contact Number	GN Division	Total	Indigeneous	Quail	Duck	Broiler	Layer	Indegeneous	Quail	Ducks	Other (Specify)	yes	No	Yes	No